# 4 ලූක් ශුභාරංචියේ පණිවුඩ

ඈත අතීතයේ සිට ම මිනිස්සු පණිවුඩ හුවමාරු කර ගැනීමට නොයෙක් ක්‍රම භාවිත කළහ. අද එදාටත් වඩා ඉතා පහසුවෙන් හා විධිමත් ආකාරයට පණිවුඩ හුවමාරු කර ගැනීමට අවස්ථා ඇත.

සිතන්න...... ඔබට වැදගත් පණිවුඩයක් ලැබුණොත් ඔබ කරන්නේ කුමක් ද? ඒ පණිවුඩයෙන් කියවෙන දේ තේරුම් ගැනීමට උත්සාහ ගන්නවා නොවේ ද? එය අන් අය සමග බෙදා ගන්නවා නොවේ ද? පණිවුඩයක වටිනාකම රදා පවතින්නේ එය අදාළ පාර්ශ්වය සමග බෙදා ගැනීමෙන් ලබන ප්‍රතිචාරය නැතහොත් ප්‍රතිඵලය මත ය.

අද ඔබේ ජීවිතයට වැදගත් පණිවුඩයක් ලැබෙන දිනයක්. .... ශුද්ධ වූ ලූක් තුමා විසින් රචිත ශුභාරංචිය ගැන අපි කතා කළෙමු. අද එහි අන්තර්ගත පණිවුඩය ගැන මෙනෙහි කරමු. ශුද්ධ වූ ලූක් තුමාගේ ශුභාරංචියෙහි පණිවුඩ මුළු ලෝකයට ම ය. ඒ නිසා ම ලූක් ශුභාරංචියෙහි ඇතුළත් පණිවුඩවල විශ්වීය බවක් දක්නට ලැබේ. එසේ නම් ලූක් ශුභාරංචියෙහි කිතුනු ජීවිතයට හා එහි පැවැත්මට වැදගත් වන පණිවුඩ මොනවා දැයි හඳුනා ගනිමු.

## 1. ප්‍රීතිය හා තුති පැසසුම්

සිත සතුටින් පුරවන ප්‍රශංසා ගීවලින් මෙම ශුභාරංචිය සැකසී ඇත.

- මරියාවන්ගේ උදාන ගීය (ලූක් 1:46-55)
- සෙකරියස් තුමාගේ ප්‍රශංසා ගීය (ලූක් 1:68-79)
- දේව දූතයින්ගේ පැසසුම් ගීය "අති උසස් තැන්හි දෙවිඳුන්ට මහිමය ද මිහි පිට දේව ප්‍රසාදය ලත් ජනයා අතර සාමය ද වේවා"යි ගැයූහ (ලූක් 2:14).
- විමුක්තිදායකයාණන් හඳුනා ගත් සිමියොන්ගේ ගීය (ලූක් 2:29-32)

අපි ද ප්‍රීතිමත් සැම අවස්ථාවක ම දෙවියන් වහන්සේ අමතක නොකොට උන්වහන්සේට ප්‍රශංසා කළ යුතු බව මතක තබා ගනිමු. දේව ප්‍රශංසාවෙන් ජීවිතය සරසා ගනිමු.

## 2. තමන් සතු දෙය වගකීමෙන් යුක්ත ව පරිහරණය කිරීම

- ස්නාවක ජොහන් තුමා ඇති අය නැති අය සමග බෙදා ගැනීමට ආරාධනා කරයි (ලූක් 3:10-14).
- පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවේ දී ධනයට ලොල් වීමට එරෙහි ව ජේසුස් වහන්සේ දේශනා කළ සේක (ලූක් 12:13-21, 16:14).
- ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාවෙන් ද මේ බව අවධාරණය කරයි.

අගනා නීල-රක්ත වස්ත්‍ර හා සිනිඳු සේද රෙදි හැඳ ගත්, සැමදා සැප විහරණයෙන් කල් යැවූ එක් ධනපතියෙක් විය. ඔහුගේ නිවසේ දොරටුව ළඟ ඇඟ පුරාම වණ තිබූ ලාසරස් නම් එක් හිඟන්නෙක් ගෙනවුත් තබන ලදි. ඔහු ධනපතියාගේ කෑම මේසයෙන් වැටෙන කැබලිවලින් වුව ද සාගිනි නිවා ගැනීමට සතුටු විය. බල්ලෝ පවා ඔහුගේ වණ ලෙව කෑවෝ ය. ඒ හිඟන්නා මිය ගිය පසු දේව දූතයන් විසින් ඔහු ආබ්‍රහම් ළඟට ගෙන යන ලද්දේ ය. ධනපතියාත් මැරී භූමදාන කරන ලද්දේ ය. ඔහු ආත්ම භවනෙහි වධ විඳිමින් ඇස් ඔසවා ආබ්‍රහම් ද ඔහුගේ තුරුල්ලේ හුන් ලාසරස් ද දුරින් දැක, මොරගසා, "ආබ්‍රහම් පියතුමෙනි, මට කරුණා කොට, තම ඇඟිලි තුඩ දියේ ගිල්වා, මාගේ දිව තෙමාලන පිණිස ලාසරස් එවනු මැනව. මන්ද, මම මේ ගිනි ජාලවෙහි දහදුක් විඳිමි"යි කීය. එහෙත් ආබ්‍රහම් පිළිතුරු දෙමින්, "පුත්‍රය, ඔබ ජීවත් ව සිටිය දී හැම සැපත ම ඔබට තිබුණු බව ද එලෙස ම හැම විපත ම ලාසරස්ට තිබුණු බව ද සිහි කරගන්න. එහෙත් දැන් ඔහු මෙහි සැනසිලි ලබයි; ඔබ දහදුක් විඳින්නෙහි ය."

(ලූක් 16:19-31)

ධනපතියාට ස්වර්ගයට යාමට නොලැබුණේ ලාසරස් පිළිබඳ සොයා බලා ඔහුට උදව් උපකාර නොකළ නිසා ය. ධනය දුගීන් වෙනුවෙන් වැය නොකළ නිසා ය. එම නිසා ධනයට හා ලෞකික දේවලට වහල් නොවී ඒවා වගකීමෙන් යුතු ව පරිහරණය කිරීමට අප උනන්දු විය යුතු ය. ඇති හැකි අය නැති බැරි අය සමග බෙදා ගත යුතු බව මතක තබා ගත යුතු වෙමු. ඒ සඳහා සරල චාම් දිවි පෙවෙතකට හුරු වීම අත්‍යවශ්‍ය වේ. සරල චාම් දිවි පෙවෙතකට හුරු වීමට නම් අප සිතින් දිළිඳු විය යුතු වේ.

## 3. ආගමික වත් පිළිවෙත්

- ලූක් ශුභාරංචිය ආරම්භ වන්නේ සෙකරියස් තුමාගේ යාගයෙනි (ලූක් 1:5-23).
- සැම ජුදා පිරිමි දරුවකු ම දෙවියන් වහන්සේට කැප කිරීම සම්බන්ධ නීතියට ගරු කරමින් ජේසුස් වහන්සේ ද දේව මාලිගාවේ කැප කිරීමේ පිළිවෙත සඳහා ගෙන යනු ලැබූ බව ලූක් 2:22-31හි දැක්වේ.
- ජේසුස් වහන්සේ දේව මාලිගාවෙහි පාස්කු මංගල්‍යයට මරිය තුමිය හා ජුසේ තුමා සමග ගිය සේක (ලූක් 2:41-52).

සමාජයීය නීතිරීතිවලට ගරු කිරීමට අපි බැඳී සිටිමු. විශේෂයෙන් ආගමික නීතිරීති දේව වන්දනාව සඳහා අපට මඟ පෙන්වන බැවින් ඒවාට අවනත ව ජීවත්වීමට උත්සාහ කළ යුතු වෙමු. ජේසුස් වහන්සේ මෙන් අන් අය වෙනුවෙන් කැඩීමට, බිඳීමට, වැය වීමට සූදානම් විය යුතු වේ.

ශුභාරංචිය හෙළි කෙරෙන විශ්වීය හා සර්ව කාලීන පණිවුඩ අපි අපේ ජීවිත ආලෝකවත් කර ගැනීමට හේතු කර ගනිමු.

**ක්‍රියාකාරකම**

1. ලූක් ශුභාරංචියෙහි අඩංගු පණිවුඩ තුනක් සඳහන් කරන්න.
2. එම එක් පණිවුඩයක් ඔබේ ජීවිතය පොහොසත් කර ගැනීමට යොදා ගන්නා ආකාරය ලියන්න.



**ජීවිතයට බිඳක්**

***ශුභාරංචි පණිවුඩය ජීවිතයට ආලෝකයක් කර ගනිමු.***



නොමිලේ බෙදාහැරීම සඳහා ය.